**නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය තුළ සඳහන් ව්‍යාපෘති 29 කට අදාළ රු.5,120,520 ක සහතික කළ වියදම් වත්කම් ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සඳහන් කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගෙවීම් කර ඇති වත්කම් ලෙස පෙන්නුම් නොකළ බව. | වියදම් සහතික කර ණයහිමියන් ලෙස හඳුනාගෙන ඇති බැවින් 2022 වර්ෂයේදී වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය තුළ සඳහන් ව්‍යාපෘති 26 කට අදාල රු.4,554,090 ක සහතික කළ වියදම් ප්‍රදාන ලෙස වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සඳහන් කර නොතිබුණි. | බිල්පත්ද 2023 වර්ෂයද ලැබී ඇති බැවින් ප්‍රාග්ධන කර නොකළ බව. | ණය ගැතියන් ලෙස හඳුනාගෙන ඇති බැවින් 2022 වර්ෂයට ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දැක්විය යුතුය. |
| (ඇ) | LDSP ව්‍යාපෘතිය මගින් 2021 හා 2022 වර්ෂයේදී ලද මුදලින් දරන ලද පුනරාවර්තන වියදම් රු.1,189,008 ක් පුනරාවර්තන ප්‍රදාන ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පුනරාවර්තන වියදම් නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.3,002,463 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රචාරණ දැන්වීම් පුවරු ආදායම රු.75,222 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සභාවේ අනියම් සේවකයන් 19 දෙනෙකුට අදාලව සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු සියයට 03ක් වූ සේවක දායක මුදල් රු.116,204 ක් ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | වැය ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග රු.337,500 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එය රු.639,313ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | මෙම පරිත්‍යාග ගබඩා ගිණුම තුළ ඇතුළත් වන බව. | -එම- |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 06 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.2,174,364,617 ක් වූ අතර ඊට අදාල උපලේඛන අනුව එම වටිනාකම රු.2,110,062,063 ක් වූයෙන් එකතුවේ රු.64,302,554 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරුපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | ගිණුම් විෂයයන් 08 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.4,912,000 ක්වූ අතර ඊට අදාල ලේඛණය අනුව වටිනාකම රු.4,921,080 ක් වූයෙන් රු.495,564 ක වෙනසක් විය. | -එම- | ලේඛන අනුරුපි වාර්තා සමඟ සැසඳිය යුතුය. |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අතිරික්තයේ /ඌණතාවයේ හඳුනාගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම වූ රු.3,166,420 ක් ගණනය කිරීමට අදාල එම වත්කම් ගිණුම්ගත කළ වර්ෂ ඇතුළත් උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වටිනාකම රු.15,096,367 ක් වූ වත්කම් විෂයයන් 06 ක් සනාථ කර ගැනීම සඳහා විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 570 හා 571 | තැන්පත් කර වසර 02 ක කාලසීවක් ඉක්මවා තිබුණු රු.485,500 ක්වූ පොදු තැන්පත් ශේෂ 78 ක් නියාදනය කර නොතිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව. | ආදායමට ගත් බවට සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.4,637,749 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.17,445,266 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2022** | | | | **2021** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල් කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,437,000 | 2,436,695 | 1,891,095 | 870,120 | 3,036,000 | 2,036,000 | 2,349,097 | 324,520 |
| (ii) | කුලී | 10,428,000 | 4,848,201 | 5,124,094 | 1,396,977 | 9,660,875 | 4,460,875 | 5,114,074 | 1,672,870 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,565,000 | 1,128,544 | 1,440,705 | 1,111,264 | 1,965,000 | 1,465,000 | 1,215,906 | 1,423,425 |
| (iv) | වෙනත් ආදායම් | 30,765,620 | 26,517,423 | 35,679,398 | 18,537,872 | 32,006,400 | 32,006,400 | 26,697,887 | 27,699,847 |
| | | 46,195,620 | 34,930,863 | 44,135,292 | 21,916,233 | 46,668,275 | 39,968,275 | 35,376,964 | 31,120,662 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| | සභා බල ප්‍රදේශයේ වරිපනම් අය කිරීම සඳහා ග්‍රාම නිලධාරි වසම් 06 ක් තෝරාගෙන ගැසට් කර තිබුණු නමුත් තක්සේරුකිරීම් සිදුකර වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණය සිදුකර තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | වරිපනම් අයකර ගැනීම සඳහාවූ කාර්යයන් කඩිනම් කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සභාවට අයත් කඩ කාමර 06 ක් වෙනුවෙන් ලැබිය යුතු කුලී රු.84,000 ක් විය. | ආදායම දක්වා නොමැත. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 11 දිනට වත්කම් බදුදීම් වෙනුවෙන් ලැබිය යුතු වසර 01 ත් 03 අතර හිඟ ආදායම් රු.1,199,133 ක් අයවී නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | සභා බල ප්‍රදේශයේ සවිකර තිබූ දැන්වීම් පුවරු වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට වසර 01 ක් වසර 09 ත් අතර කාලයක සිට අයවිය යුතු මුදල රු.1,096,719 ක් විය. | රු.308,817 ක් අයවී ඇති බව සහ ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා නිත්‍යානුකූලව කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාකළයුතු යුතුය. |
| **(ඈ)** | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.5,336,813 ක් හා මුද්දර ගාස්තු රු.26,375,504 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ රු.331,168 ක් සහ මුද්දර ගාස්තු රු.4,524,888 ක් ලැබිය යුතු බව. | ලැබිය යුතු නිවැරදි මුදල තහවුරු කරගෙන ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කීරක්කුලම ප්‍රදේශයේ විශාල වශයෙන් බොරළු ගැනීම ප්‍රවාහනය සිදුකරමින් පැවතීම නිසා එමගින් සභා බල ප්‍රදේශයේ මාර්ගවලට වන හානිය යථාවත් කිරීම සඳහා ප්‍රවාහනය කරන බොරළු කියුබ් මත ගාස්තු අයකරන ක්‍රමවේදයක් සභාව සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | බොරළු ප්‍රවාහනය කිරීම නිසා බල ප්‍රදේශයේ මාර්ගවලට සිදුවන හානි යථාවත් කිරීම සඳහා ගාස්තු අයකර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් ගෙවිය යුතු රු.3,042,929 ක්වූ ගිණුම් ශේෂ 04 ක් නිරවුල් කිරීමට වසර 02 ක් 05 ත් අතර කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | මෙම ගාස්තු ගෙවීම සිදුකරමින් පවතින බව. | පැරණි ශේෂ ගෙවා නිරවුල් කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණය මගින් අනාවරණය වූ භාණ්ඩ වර්ග 92 කට අදාල ඒකක 577 ක ඌනතාවයන් සම්බන්ධව විමර්නයක් සිදුකර එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විමර්ශනයක් සිදුකිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බව. | පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | වෙන්දේසි ඉඩම්වලින් සභාව වෙත ලබාදී තිබූ ඉඩම් 04 ක් ඵලදායී ලෙස භාවිතා නොකිරීම නිසා නිශ්කාර්යව තිබුණි. | අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | මෙම ඉඩම් ආරක්ෂා කර ගැනීමටත් ඵලදායී ලෙස යොදා ගැනීමටත් ක්‍රියාකළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිරන කසළවලින් කාබනික පොහොර නිපදවීම සඳහා උපකරණ හෝ මධ්‍යස්ථානයක් සභාව සතුව නොපැවතුණි. | කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සකස් කිරීම සඳහා වූ යෝජනා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව. | සභා බල ප්‍රදේශයේ ජනනය වන දිරන සකළ විධිමත් ලෙස බැහැර කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. |